විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்

DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions


පරපුරක අභිමානය | தலைமுறையொன்றின் பெருமிதம் | Pride of a Generation

මගේ අංකය
எனது இல.
My No. } P.N/media/P.R

ඔබේ අංකය
உமது இல.
Your No. } ........................

දිනය
திகதி
Date } ....2015.05.07

…………………………
…………………………
…………………………

මාධ්‍ය නිවේදනයයි.

**<u>විශ්‍රාමික ප්‍රජාව සමඟ විශ්‍රාම වැටුප් බක්මහ උළෙල.</u>**

වසර 2015 සිංහල දෙමළ අලුත් අවුරුද්ද නිමිත්තෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සංවිධානය කරන බක්මහ සැණකෙළිය 2015-05-10 දවස පුරා කැළණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනයේ දී පැවැත්වේ.

මෙරට ජ්‍යෙෂ්ඨ පුරවැසි පරපුරක සංස්කෘතික උරුමය තුන්වැනි පරපුර වෙත සම්ප්‍රේෂණය කිරීම හා තුන්වැනි පරපුරක නව තාක්ෂණික දැනුම ජ්‍යෙෂ්ඨ පරපුර වෙත සම්ප්‍රේෂණය කිරීම මගින් සමාජීය වශයෙන් හා ආර්ථික වශයෙන් ද මව් රට ඔසවා තැබීම මෙවර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු බක්මහ උළලේ සංකල්පය වී ඇත.

ඒ අනුව මෙවර විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරින් ද ඔවුන්ගේ පවුල්වල අයවලුන් හා විශේෂයෙන් පුංචි දරුවන් ද මේ උළෙල සඳහා සහභාගි වේ.

පැරණි ජන ක්‍රීඩා ,කෙළි සෙල්ලම් , ජන ගායනා ,ජන කතා,චිත්‍ර ආදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙන අතර මේ පිළිබඳ උගත් විශ්‍රාමික පිරිස් විසින් එදිනට පැමිණෙන පිරිස දැනුම්වත් කිරීම ද සිදු වේ.

තව ද ශ්‍රී ලංකා යුද හමුදාව හා සිවිල් ආරක්ෂක බලකායේ පූර්ණ සහයෝගිත්වයෙන් දිනය පුරා සංගීත සංදර්ශන හා සංස්කෘතික සංදර්ශන මෙන්ම විශ්‍රාම ලත් ප්‍රවීන ගායක ගායිකාවන් නිවේදක ශිල්පීන් ,නාට්‍ය වේදීන් ඇතුලු කලාකරුවන් රැසකගේ විවිධ වැඩ සටහන් රැසක් එදින ක්‍රියාත්මක කිරීමට ද නියමිතය.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්


මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10, Maligawatta, Colombo 10.
Hot line : 1970, Direct line : 2209800, Fax : 2342078, Email : info@pensions.gov.lk, web : www.pensions.gov.lk